සැ.යු .- මෙම ගැසට් පත්‍රය නැවත මුද්‍රණයකි.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 757/7 – 1993 මාර්තු මස 10 වැනි බදාදා – 1993.03.10

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්ඩී-බී123/48.

වෛද්‍ය ආඥා පනත

(105 වැනි අධිකාරය) වන වෛද්‍ය ආඥාපනතේ 25, 33, 41 (3), 45, 52, 57, 60 (ඇ) සහ 64 වැනි වගන්ති සමග කියවිය යුතු, 72 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍යවරිය විසින් පනවන ලද නියෝග.

රේණුකා හේරත්,
සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍ය.

1992 නොවැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

වෘත්තිකයින්ට විරුද්ධ පැමිණිලි

I කොටස

01. මෙම නියෝග 1990 වෛද්‍ය විනය (කාර්‍ය පරිපාටි) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. (1) ආඥා පනතේ 25 (1) (අ) වගන්තිය යටතේ ක්‍රියා කිරීමට, (මෙහි මින්මතු 'සභාව' යනුවෙන් හඳුන්වනු ලබන) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට බලය පැවරෙන හේතුවක් ඇති බවට කිසියම් සිද්ධියක් හෝ කාරණයක් කිසියම් වෘත්තිකයෙකු විසින් කළ බවට ඔහුට විරුද්ධ පැමිණිල්ලක් හෝ වාර්තාවක් සභාවට යැවූ විට, (මෙහි මින්මතු සභාපති යනුවෙන් හඳුන්වනු ලබන) සභාවේ සභාපති විසින් මෙම රෙගුලාසිවල මින් ඉදිරියට දක්වනු ලබන විධිවිධාන වලට යටත්ව, වෘත්තීය චර්යා කමිටුව විසින් පරීක්ෂා කළ යුතු සිද්ධියක් ඇත්ද? යන වග සලකා බලා වාර්තා කිරීම සඳහා එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් ප්‍රාථමික ක්‍රියාමාර්ග කමිටුවට ඉදිරිපත් කරන ලෙස (මෙහි මින්මතු 'ලේඛකාධිකාරී' යනුවෙන් හඳුන්වනු ලබන) සභාවේ ලේඛකාධිකාරීට නියම කළ යුතු ය.

(2) එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් වෘත්තිකයකුගේ වෘත්තීය රාජකාරිවලට අදාළ හැසිරීම හෝ පැහැර හැරීම හෝ අයෝග්‍යවීමට සම්බන්ධයෙන් වන විට එවැනි හැසිරීම වෘත්තීය ගරුත්වයට අපකීර්තිය ගෙන දෙන හැසිරීමක් වන බව හෝ එවැනි පැහැර හැරීම හෝ අයෝග්‍යවීම වෘත්තිකයකු වශයෙන් තවදුරටත් කටයුතු කිරීමට වෘත්තිකයාට ඉඩදිය නොහැකි වෘත්තීය යුතුකම් පැහැර හැරීමක් හෝ අයෝග්‍යවීමක් සම්බන්ධයෙන් වන බව සභාපතිට පෙනී නොයන විට හෝ කිසියම් පැමිණිල්ලක් හෝ වාර්තාවක් වෘත්තිකයකු අධිකරණයක් මගින් වරදකරුවෙකු කිරීම සම්බන්ධයෙන් වන විට සහ වෘත්තිකයා වරදකරුවකු කිරීමට සිදු කරනු ලැබුවේ යයි කියනු ලබන වරද වෘත්තිකයකු වශයෙන් කටයුතු කිරීම සඳහා ඔහු නුසුදුසු වන බවක් සභාපතිවරයාට පෙනී නොයන විට, සභාපතිවරයා විසින් එම පැමිණිල්ල හෝ වාර්තාව කමිටුවට ඉදිරිපත් කිරීම වෙනුවට, එවැනි පැමිණිල්ල හෝ වාර්තාව ඊළඟ රැස්වීමේදී සලකා බැලීම සඳහා සභාවට ඉදිරිපත් කරන ලෙස ලේඛකාධිකාරිවරයාට නියම කළ යුතු ය.

(3) වෘත්තිකයකුට විරුද්ධව 1 වැනි ඡේදයේ සඳහන් ස්වභාවයේ පැමිණිල්ලක් හෝ වාර්තාවක් :–

(අ) වෘත්තිකයාට විරුද්ධ සිද්ධි හෝ කරුණු ලේඛකාධිකාරීවරයා අමතන ලද ලිඛිත ප්‍රකාශයක් මගින් ඉදිරිපත් කරන්නේ නම් සහ

(ආ) එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් මගින් කිසියම් වෘත්තීය කරුණක් සම්බන්ධ අපකීර්තිමත් හැසිරීමක් හෝ වෘත්තීය යුතුකම්වලට සම්බන්ධ පැහැර හැරීමක් හෝ අයෝග්‍යවීමක් වන විට, එම පැමිණිල්ලේ හෝ වාර්තාවේ සඳහන් සිද්ධි හෝ කරුණු සනාථ කෙරෙන දිවුරුම් පෙත්සමක් හෝ දිවුරුම් පෙත්සම් මගින් සනාථ කරන්නේ නම්,

මිස, එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් භාර නොගත යුතු ය.

කෙසේ වෙතත්, එවැනි පැමිණිල්ල හෝ වාර්තාව රාජ්‍ය නිල තත්ත්වයෙන් ක්‍රියා කරන පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කරන විට (ආ) අනු ඡේදයෙහි දැක්වෙන විධිවිධාන අදාළ නොවිය යුතු ය.

1A – CM24315 – 250 (2017/03) දෙවන මුද්‍රණය – 2017

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(4) මෙම නියෝගයේ පෙර සඳහන් කරන ලද විධිවිධානවල දැක්වෙන ඕනෑම පැමිණිල්ලක් හෝ වාර්තාවක් සමග ඉදිරිපත් කරනු ලබන සෑම දිවුරුම් පෙත්සමකම අනෙකුත් කරුණු අතර, සිද්ධි ප්‍රකාශකයාගේ/ප්‍රකාශකයාගේ නම, තනතුර සහ ලිපිනය ද සඳහන් කළ යුතු අතර, එවැනි දිවුරුම් පෙත්සමක සඳහන් කරන ලද කිසියම් සිද්ධියක් හෝ කාරණයක් සිද්ධි ප්‍රකාශකයාගේ/ප්‍රකාශකයාගේ පෞද්ගලික දැනුමෙන් තොර වන විට සිද්ධි ප්‍රකාශකයා/ ප්‍රකාශකයා එම තොරතුරු ලබා ගත් මාර්ගය සහ එහි සඳහන් සිද්ධිවල හෝ කාරණාවල සත්‍යතාවය කෙරෙහි වන ඔහුගේ විශ්වාසයට හේතු ද සඳහන් කළ යුතු ය. එම පැමිණිල්ල හෝ වාර්තාව පිළිබඳව, වෘත්තිකයාට අප්‍රමාදව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5) (1) මෙම නියෝගයේ "රාජ්‍ය නිල තත්ත්වයෙන් ක්‍රියා කරන පුද්ගලයෙකු" යනුවෙන් අදහස් කෙරෙන්නේ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද ඕනෑම විශ්වවිද්‍යාලයක උපකුලපති හෝ ලේඛකාධිකාරී, හෝ රජයේ දෙපාර්තමේන්තුවක ප්‍රධානියෙක් හෝ ඕනෑම මහ නගර සභාවක නගරාධිපති හෝ ඕනෑම නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක සභාපති හෝ ලේඛකාධිකාරී වේ.

3. (1) අංක: 2 (2) දරන නියෝගය අනුව ලේඛකාධිකාරී විසින් කිසියම් පැමිණිල්ලක් හෝ වාර්තාවක් සභාවට ඉදිරිපත් කළ විට, සභාව විසින් එය සලකා බලා එකී පැමිණිල්ල හෝ වාර්තාව සභාවට ඉදිරිපත් කළ විට, සභාව විසින් එය සළකා බලා එකී පැමිණිල්ල හෝ වාර්තාව හෝ එහි කිසියම් කොටසක් කමිටුවට ඉදිරිපත් කළ යුතු ද නැද්ද යන වග තීරණය කළ යුතු ය.

(2) එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් හෝ එහි කිසියම් කොටසක් කමිටුවට ඉදිරිපත් නොකළ යුතුය යයි සභාව තීරණය කළහොත්, ලේඛකාධිකාරීවරයා එකී තීරණය ගැන පැමිණිලිකරුට දැන්විය යුතු ය. එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් හෝ එහි කිසියම් කොටසක් කමිටුවට ඉදිරිපත් කළ යුතුයයි සභාව තීරණය කළහොත්, එය සළකා බලා වාර්තා කිරීම සඳහා ලේඛකාධිකාරීවරයා එය කමිටුවට ඉදිරිපත් කළ යුතු ය.

4. මෙම නියෝගවල පෙර සඳහන් කරන ලද විධිවිධාන අනුව පැමිණිල්ලක් හෝ වාර්තාවක් කමිටුවට ඉදිරිපත් කර ඇති විට, ලැබී ඇති පැමිණිල්ල හෝ වාර්තාව ගැන සඳහන් කරමින් එහි දැක්වෙන කළාය කියන සිද්ධිය හෝ කාරණය ගැන වෘත්තිකයාට දන්වන ලෙසත්, 2 (3) නියෝගය යටතේ ඉදිරිපත් කර ඇති එක් එක් දිවුරුම් පෙත්සමේ පිටපතක් වෘත්තිකයාට යවන ලෙසත්, වෘත්තිකයාට විරුද්ධ පැමිණිල්ලේ හෝ වාර්තාවේ දැක්වෙන ඔහු කළායි කියන සිද්ධි හෝ කාරණා සම්බන්ධයෙන් වෘත්තිකයා විසින් ඉදිරිපත් කළ හැකි කරුණු පැහැදිලි කිරීම් කිසිවක් වෙතොත් ඒවා කමිටුවට ඉදිරිපත් කරන මෙන් ඉල්ලීමක් කරන ලෙසත් සභාපතිවරයා විසින් ලේඛකාධිකාරීවරයාට නියම කළ යුතු ය.

5. කමිටුවට පහත සඳහන් බලතල තිබිය යුතු ය :–

(අ) ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි සපයා ගැනීමට සහ ලබා ගැනීමට සහ කමිටුව විසින් සපයා ගැනීම හෝ පරීක්ෂා කිරීම අවශ්‍ය හෝ යෝග්‍ය යයි සලකන සාක්ෂිකරුවන් වන සියළු පුද්ගලයින් පරීක්ෂා කිරීමට ;

(ආ) ඕනෑම සාක්ෂිකරුවෙකුගේ (ලිඛිත හෝ වාචික) සාක්ෂි දිවුරුම හෝ සහතික කිරීම මත ලබා ගැනීමට, එම දිවුරුම හෝ සහතික කිරීම සාක්ෂිකරුවා අධිකරණයක දී සාක්ෂි දීමේදී කරන ආකාරයට සිදු කිරීමට, සහ කමිටුව විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් එවැනි සාක්ෂිකරුවෙකුගෙන් දිවුරුම හෝ සහතික කිරීම ලබා ගැනීමට හෝ එය ලබා ගැනීම සැලැස්වීමට; සහ

(ඇ) කමිටුවේ ඕනෑම රැස්වීමකට සහභාගිවීමට, සාක්ෂි දීමට සහ ඔහු සන්තකයේ තිබෙන ඕනෑම ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට සහ සාක්ෂිකරුවෙකු වශයෙන් ඔහු පරීක්ෂා කිරීමට හෝ ඔහු සන්තකයේ තිබෙන ඕනෑම ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාව තුළ වෙසෙන ඕනෑම පුද්ගලයෙකු කැඳවීමට.

6. මෙහි පළමු වැනි උපලේඛනයේ දක්වා ඇති විධිවිධාන ව්‍යවස්ථාවට සහ කමිටුවේ රැස්වීම්වලදී අනුගමනය කළයුතු ක්‍රියා පරිපාටියට අදාළ විය යුතු අතර, ඊට සම්බන්ධ විය යුතු ය.

7. (1) ලේඛකාධිකාරීවරයා කමිටුවේ ලේකම් විය යුතු අතර, කමිටුව විසින් නිකුත් කරනු ලබන සෑම සිතාසියක්, නිවේදනයක් හෝ වෙනත් ලේඛනයක් කමිටුව වෙනුවෙන් ලේඛකාධිකාරීවරයා විසින් අත්සන් කළ යුතු ය.

(අ) කිසියම් සිතාසියක් එහි නම සඳහන් තැනැත්තාට භාර දිය යුතුය. එසේ කිරීම අපහසු නම් ඔහු අවසන් වරට පදිංචි වී සිටි ස්ථානයේ තැබිය යුතු ය.

(ආ) සිතාසි භාර දෙනු ලැබූ සෑම පුද්ගලයෙක්ම එහි සඳහන් වේලාවේදී සහ ස්ථානයේ දී කමිටුව ඉදිරියේ පෙනී සිට සාක්ෂිදීම හෝ ඔහු විසින් ඉදිරිපත් කළ යුතු සහ ඔහු සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ තිබෙන ලේඛන කිසිවක් හෝ වෙනත් දේ සිතාසියේ දක්වා ඇති ආකාරයට ඉදිරිපත් කළ යුතු ය.

8. මෙම නියෝග යටතේ සිතාසි භාර දෙනු ලැබූ කිසියම් පුද්ගලයෙක් :–

(i) සිතාසියේ සඳහන් කර ඇති වේලාවේදී සහ ස්ථානයේදී, කමිටුව සාධාරණ යයි සිතන ආකාරයට හේතු රහිතව කමිටුව ඉදිරියේ පෙනී සිටීමට අපොහොසත් වන්නේ නම් ද,

(ii) දිවුරුම්දීමට ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ, යථා පරිදි දිවුරුම් දීමෙන් පසු, කමිටුව විසින් පරීක්ෂා කිරීමට නියම කර ඇති කරුණුවලට අදාලව ඔහුගෙන් අසනු ලබන ප්‍රශ්නවලට කමිටුව සාධාරණ යයි අදහස් කරන පරිදි හේතු රහිතව පිළිතුරු දීමට ප්‍රතික්ෂේප කරන්නේ නම් ද, හෝ

(iii) කමිටුව විසින් සාධාරණ යයි සිතන ආකාරයට ඔහු සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ තිබෙන කිසියම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් සහ කමිටුවේ අදහසේ හැටියට පරීක්ෂා කිරීමට තිබෙන කරුණු පිළිබඳව සත්‍යයට ළඟාවීමට අවශ්‍යයයි කමිටුව අදහස් කරනු ලබන එවැනි ලේඛන හෝ වෙනස් දේ කමිටුවට ඉදිරිපත් කිරීමට සහ පෙන්වීමට හේතු රහිතව ප්‍රතික්ෂේප කරන්නේ නම් හෝ අපොහොසත් වන්නේනම්, එවැනි පුද්ගලයෙක් මෙම රෙගුලාසි යටතේ වරදකට වරදකරු විය යුතු ය.

9. කමිටුව පරීක්ෂණ පැවැත්වීම හෝ කිසියම් පුද්ගලයෙකුගේ සාක්ෂි ඇසීම රහසේ කළ යුතු ය.

10. පරීක්ෂණය අවසන් වූ විට, පැමිණිල්ලේ හෝ වාර්තාවේ සඳහන් සිදු කළායි කියනු ලබන එක් එක් සිද්ධියට හෝ කාරණාවට අදාළව එහි තීරණ ඇතුලත් කරමින් වාර්තාවක් පිළියෙල කොට එකී පැමිණිල්ලේ හෝ වාර්තාවේ පිටපතක් ද සමග වෘත්තීය චර්යා කමිටුවට යැවිය යුතු ය.

11. මෙම රෙගුලාසිවල දෙවැනි උපලේඛනයේ දක්වා ඇති විධිවිධාන වෘත්තීය චර්යා කමිටුවේ ව්‍යවස්ථාවට සහ රැස්වීම්වලදී අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටියට අනුකූල විය යුතු අතර, ඊට අදාළ විය යුතු ද වේ.

12. (1) මෙම නියෝගවල පෙර සඳහන් කළ විධිවිධාන යටතේ සළකා බැලීම පිණිස කමිටුවට යොමු කරන ලද කිසියම් පැමිණිල්ලක් හෝ වාර්තාවක් හෝ එහි කොටසක් මත 10 වැනි නියෝගය යටතේ වෘත්තීය චර්යා කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කළ වහාම කමිටුවේ වාර්තාව වෘත්තීය චර්යා කමිටුව විසින් සළකා බලා, පැමිණිල්ලේ හෝ වාර්තාවේ දැක්වෙන සිදු කළැයි කියනු ලබන සිද්ධි හෝ කාරණා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු ද නැද්ද යන වග තීරණය කළ යුතු ය.

(2) පරීක්ෂණයක් නොපැවැත්විය යුතු බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කළ විට, ඒ අනුව පැමිණිලිකරුට සහ වෛද්‍යවරයාට දන්වන ලෙස වෘත්තීය චර්යා කමිටුව, ලේඛකාධිකාරීවරයාට නියම කළ යුතු ය.

(3) කමිටු වාර්තාවේ ඇතුලත් වන සියළුම කරුණු හෝ කිසියම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු යයි වෘත්තීය චර්යා කමිටුව තීරණය කළ විට, සාරානුකූලව මෙම නියෝගවල තුන්වැනි උපලේඛනයහි දක්වා ඇති ආකෘති පත්‍රයෙහි වෘත්තිකයාට විරුද්ධව නගා ඇති චෝදනාව හෝ චෝදනා නිශ්චිතව සඳහන් කරමින් (මෙහි මින්මතු "නිවේදනය" යනුවෙන් හඳුන්වනු ලබන) පරීක්ෂණ නිවේදනයක් වෘත්තිකයාට භාර දෙන ලෙස සභාව නියෝජනය කරන නීතිඥවරයාට ලේඛකාධිකාරීවරයා උපදෙස් දිය යුතු ය.

(4) වෘත්තිකයාගේ කැමැත්ත අනුව මිස, නිවේදනය වෘත්තිකයාට භාරදී දින විසි අටක් ගතවීමට පෙර දිනයකට පරීක්ෂණයක් යොදා නොගත යුතු ය.

(5) එවැනි සෑම නිවේදනයක්ම ලේඛනයෙහි දැක්වෙන වෘත්තිකයාගේ ලිපිනයට හෝ දැන ගැනීමට ලැබී ඇති ඔහුගේ අන්තිම ලිපිනය ලේඛනයේ දැක්වෙන ලිපිනයට වෙනස් වන්නේ නම් ද එකී අන්තිම ලිපිනයට නිවේදනය යැවීම වඩා ඵලදායක වන බැව් නීතිඥවරයාට පෙනී යන්නේ නම් ද එකී ලිපිනයට හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

(6) එකී නිවේදනය සමඟ මෙම නියෝගවල පිටපතක් ද යැවිය යුතු ය.

(7) පැමිණිලිකරුවෙකු සිටින සෑම අවස්ථාවකම, නිවේදනයේ පිටපතක් පැමිණිලිකරුටද යැවිය යුතු ය.

(8) කිසියම් පරීක්ෂණයක පාර්ශ්වකරුවෙකු විසින් අයදුම් පතක් ඉදිරිපත් කළ විට, ඒ වෙනුවෙන් සභාව විසින් නියම කරනු ලබන ගාස්තු ගෙවීමෙන් පසු, අනිත් පාර්ශ්වය විසින් සභාව වෙත යවන ලද කිසියම් දිවුරුම් පෙත්සමක, කරුණු පැහැදිලි කිරීමක හෝ වෙනත් ප්‍රකාශයක හෝ සංදේශයක පිටපත් යථෝක්ත පාර්ශ්වයට යැවිය යුතු ය.

13. (1) පරීක්ෂණයක් පැවැත්වීමට පෙර හෝ පරීක්ෂණයක් පැවැත්වෙමින් තිබෙන ඕනෑම අවස්ථාවක පරීක්ෂණය පිළිබඳ නිවේදනය සදොස් බැව් වෘත්තීය චර්යා කමිටුවට පෙනී ගියහොත්, කාරණයේ යෝග්‍යතාවය ගැන සළකා බැලීමෙන් මිස, අසාධාරණයකින් තොරව, අවශ්‍ය සංශෝධන කළ නොහැකි විට වෘත්තීය චර්යා කමිටුව අවශ්‍ය යයි සළකන පරිදි කාරණයට අදාල වන සේ නිවේදනය සංශෝධනය කිරීමට නීතිඥවරයාට උපදෙස් දිය යුතු ය.

(2) මෙම නියෝගයේ පෙර සඳහන් විධිවිධානවලට අනුව නිවේදනයක් සංශෝධනය කළ විට, පරීක්ෂණය කල් දැමීම හෝ කලකට අත්හිටුවීම සුදුසු යයි වෘත්තීය චර්යා කමිටුව අදහස් කරන්නේ නම් එසේ කළ හැකි ය. නැතහොත් කාරණයට අදාල වන පරිදි වෘත්තීය චර්යා කමිටුවට අවශ්‍ය සේ පෙනී යන වෙනත් නියෝග දිය හැකි ය.

(3) පරීක්ෂණයක කිසියම් පාර්ශ්වකරුවෙකු විසින් අයදුම්පතක් ඉදිරිපත් කළ විට හෝ වෘත්තීය චර්යා කමිටුවේම යෝජනාවක් අනුව, වෘත්තීය චර්යා කමිටුව විසින් තීරණය කරනු ලබන පසු දිනයකට පරීක්ෂණයක් කල් දැමීම හෝ කලකට අත්හිටුවීම කළ හැකි ය.

වෘත්තීය චර්යා කමිටුවේ විභාග කිරීම්වල ක්‍රියා මාර්ග:–

## II කොටස

### අ.– ප්‍රාථමික විරෝධතා

14. නිවේදනයේදී නියම කරන ලද දිනයේදී සහ වේලාවේදී වෘත්තීය චර්යා කමිටුව ඉදිරියේ පෙනී සිටීමට වෘත්තිකයා අපොහොසත් වූ විට, මෙම නියෝගවල විධිවිධානවලින් අවශ්‍ය වන පරිදි පරීක්ෂණය පිළිබඳ නිවේදනයක් වෘත්තිකයාට නිසියාකාරව භාර දෙන ලද්දේද යන වග සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුව සෑහීමට පත් කරන ලෙස වෘත්තීය චර්යා කමිටුව නීතිඥවරයාගෙන් ඉල්ලා සිටිය යුතු අතර, නිවේදනය එසේ භාරදී ඇති බවට සෑහීමට පත් වුවහොත්, පරීක්ෂණයේ කටයුතු කරගෙන යා හැකිය.

15. (1) වෘත්තීය චර්යා කමිටුව ඉදිරියේ වෘත්තිකයා පෙනී සිටින විට හෝ පෙනී සිටීමට ඔහු අපොහොසත් වූ විටෙක පරීක්ෂණයේ කටයුතු කරගෙන යාමට වෘත්තීය චර්යා කමිටුව තීරණය කළහොත් වෘත්තිකයාට විරුද්ධව ඇති චෝදනාව හෝ චෝදනා නීතිඥවරයා විසින් ප්‍රථමයෙන් වෘත්තීය චර්යා කමිටුවට කියවිය යුතු ය.

(2) චෝදනාව හෝ චෝදනා කියවීමෙන් පසු, වෘත්තිකයා පැමිණ සිටින්නේ නම් සහ ඔහු කැමති නම්, කිසියම් චෝදනාවකට හෝ චෝදනාවලට නීති ප්‍රශ්නයක් මත විරෝධතා දැක්වීමට ඔහුට හැකි අතර, එවැනි විරෝධතාවක් ඉදිරිපත් කළ විට නීතිඥවරයා ඊට පිළිතුරු දිය යුතු ය.

(3) එවැනි කිසියම් විරෝධතාවක් පිළිගත හොත්, විරෝධතාවයට අදාළ චෝදනාව සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුව විසින් තවදුරටත් ක්‍රියා නොකළ යුතු ය.

(ආ) වෘත්තිකයාගේ චර්යාවට අදාළ සිද්ධි :-

16. වෘත්තිකයාගේ චර්යාවට අදාළ සිද්ධි සම්බන්ධයෙන් වන පරීක්ෂණවලදී 14 සහ 15 වැනි නියෝගයන්හි විධිවිධානවලට හානියක් නොවන පරිදි පහත සඳහන් ක්‍රියාපටිපාටිය නිරීක්ෂණය කළ යුතු ය:–

(1) කමිටුවේ වාර්තාවට පදනම් වී ඇති සිද්ධි නීතිඥවරයා ඉදිරිපත් කළ යුතු ය.

(2) සිදු කළැයි කියන චෝදනාවේ හෝ චෝදනාවල හෝ තමා විසින් ඔප්පු කිරීමට සූදානම් වන චෝදනාවේ හෝ චෝදනාවල අඩංගු සිද්ධි පිළිබඳ සාක්ෂි නීතිඥවරයා ගෙනහැර දැක්විය යුතු ය.

(3) කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් එසේ සාක්ෂි ගෙන හැර නොදක්වන්නේ නම්, චෝදනාවට අදාළ වන කරුණු සම්බන්ධයෙන් ප්‍රස්ථාරයේ හැටියට වෘත්තීය කරුණක් පිළිබඳ අපකීර්තිමත් චර්යාව හෝ වෘත්තීය යුතුකම්වලට අදාළ පැහැර හැරීම හෝ අයෝග්‍යතාවය පිළිබඳ වෘත්තිකයා නිවැරදිකරු වන බවට වෘත්තීය චර්යා කමිටුව වාර්තා කළ යුතු අතර, සභාපතිවරයා නිවේදනය කළ යුතු ය.

(4) වෘත්තිකයාට විරුද්ධ නඩුව අවසන් වූ පසු, ඔහු කැමති නම්, සාක්ෂි ගෙනහැර දක්වන ලද කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශවලින් එකක් හෝ දෙකම හෝ ඉදිරිපත් කිරීමට ඔහුට හැකි ය.

එනම්:–

(අ) චෝදනාවෙහි සඳහන් වන සිදු කළැයි කියන සිද්ධි වෘත්තීය චර්යා කමිටුවට ඔප්පු කළ හැකි වන පරිදි ප්‍රමාණවත් සාක්ෂි ගෙන හැර දක්වා නොමැති බව, හෝ

(ආ) චෝදනාවෙහි සඳහන් වන සිදු කළැයි කියන සිද්ධිවල වෘත්තීය ගරුත්වය පිළිබඳ අපකීර්තිමත් චර්යාවක් හෝ වෘත්තිකයකු වශයෙන් කටයුතු කිරීමට ඔහු නුසුදුසුවන වෘත්තීය යුතුකම්වලට අදාළ පැහැර හැරීමක් හෝ අයෝග්‍යවීමක් අඩංගු නොවන බව, ඉහත සඳහන් වන පරිදි කරුණු ඉදිරිපත් කිරීමක් සිදු වූ විට නීතිඥවරයා ඊට පිළිතුරු දිය යුතු ය.

(5) (අ) පෙර සඳහන් කළ අන්තිම ඡේදය යටතේ කරුණු ඉදිරිපත් කිරීමක් සිදු වූ විට, වෘත්තීය චර්යා කමිටුව එය සලකා බලා එය පිළිගත යුතුද නැද්ද යන වග සම්බන්ධයෙන් තීරණයක් ගත යුතු ය.

(ආ) කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද කරුණු පිළිගැනීමට වෘත්තීය චර්යා කමිටුව තීරණය කළ විට ප්‍රස්ථාරයේ හැටියට එම චෝදනාවට අදාළ වන කරුණු සම්බන්ධයෙන් වෘත්තීය ගරුත්වය පිළිබඳ අපකීර්තිමත් චර්යාව හෝ වෘත්තීය යුතුකම්වලට අදාළ වන පරිදි පැහැර හැරීමක් හෝ අයෝග්‍ය වීමක් අරභයා වෘත්තිකයා නිවැරදි කරු වන බවට තීන්දුවක් වෘත්තීය චර්යා කමිටුව විසින් සටහන් කර ගත යුතු ය.

(ඇ) එවැනි කරුණු ඉදිරිපත් කිරීමක් පිළිබඳව වෘත්තීය චර්යා කමිටුව තීරණයකට එළඹි විට, වෘත්තීය චර්යා කමිටුව යෝග්‍ය යයි සිතන ආකාරයට වෘත්තීය චර්යා කමිටුවේ තීරණය සභාපතිවරයා විසින් ප්‍රකාශයට පත් කළ යුතු ය.

(6) චෝදනාවක් සම්බන්ධයෙන් සාක්ෂි ගෙන හැර දක්වන ලද විට, එම චෝදනාව අසත්‍ය බව ඔප්පු කිරීම සඳහා සාක්ෂි ගෙනහැර දැක්වීමට වෘත්තිකයාට හැකි අතර ඔහු, සාක්ෂි ගෙනහැර දැක්වුවත් නැතත් වෘත්තීය චර්යා කමිටුව ඇමතිය හැකිය. මෙම ඡේදය යටතේ එක් ඇමතීමකට පමණක් අවසර දිය හැකි අතර, වෘත්තිකයා සාක්ෂි ගෙනහැර දක්වන්නේ නම්, එම ඇමතීම කළ යුත්තේ සාක්ෂිදීම ඇරඹීමට පෙර හෝ එය අවසන් වූ පසුව ය.

(7) වෘත්තිකයා වෙනුවෙන් නඩුවේ කටයුතු අවසන් කළ පසු වෘත්තිකයා විසින් ගෙන හැර දක්වන ලද කිසියම් සාක්ෂියක් නිෂ්ප්‍රභ කිරීම සඳහා වෘත්තීය චර්යා කමිටුවේ අවසරය පිට, සාක්ෂි ගෙන හැර දැක්වීමට නීතිඥවරයාට හැකි අතර, ඔහු එසේ කරන්නේ නම් තවත් ඇමතීමක් කිරීමට වෘත්තිකයාට හැකි වන අතර, එම ඇමතීම සාක්ෂි නිෂ්ප්‍රභ කිරීමට සීමා විය යුතු ය.

(8) වෘත්තිකයාගේ නඩුවට පිළිතුරු වශයෙන් :–

(අ) වෘත්තිකයා වෙනුවෙන් වාචික සාක්ෂි (වෘත්තිකයා සම්බන්ධයෙන් මිස ඔහුගේ චරිතය පිළිබඳ සාක්ෂි නොවන) මෙහෙයවා ඇත්නම් හෝ,

(ආ) එවැනි සාක්ෂි දී නොමැති නඩුවක් සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුවේ අවසරය ඇතිව, වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට නීතිඥවරයාට හැකි ය.

(9) මීට පෙර දැක්වුණු ඡේදයේ විධිවිධානවලට හානියක් නොවන පරිදි, නීති ප්‍රශ්ණයක් මත වෘත්තිකයා වෘත්තීය චර්යා කමිටුවට කරුණු ඉදිරිපත් කර ඇති විට එම කරුණු දැක්වීමට සීමා වන පරිදි පිළිතුරු දීමේ අයිතියක් නීතිඥවරයාට තිබිය යුතු ය.

17. හැසිරීම පිළිබඳ නඩුවකදී වෘත්තිකයා පෙනී සිටීමට අපොහොසත් වන විට, පරීක්ෂණයේ කටයුතු කර ගෙන යාමට වෘත්තීය චර්යා කමිටුව තීරණය කර ඇත්නම් එවැනි පරීක්ෂණයක් සම්බන්ධයෙන් 16 වැනි නියෝගයේ (4) සිට (9) දක්වා වන ඡේදවල විධිවිධාන අදාළ නොවිය යුතු ය.

18. (1) 16 වැනි නියෝගය හෝ 17 වැනි නියෝගය යටතේ වන ක්‍රියා මාර්ග අවසන් වූ පසු, චෝදනාව හෝ එකකට වැඩි චෝදනා ගණනක් ඇති විට එකී චෝදනාවලින් ඉවත ලන ලද චෝදනාවක් හැර, එකී ඕනෑම එක් චෝදනාවක් වෘත්තීය චර්යා කමිටුව සෑහීමට පත්වන පරිදි, ඔප්පු කර ඇද්ද යන වග වෘත්තීය චර්යා කමිටුව විසින් සලකා බලා තීරණය කළ යුතු ය.

(2) ඉවත ලන ලද චෝදනාවක් යනුවෙන් (1) වැනි ඡේදයෙහි සඳහන් කරන ලද්දේ, වෘත්තිකයාට නුසුදුසුවන වෘත්තියෙහි යෙදීමට වෘත්තීය කරුණක් පිළිබඳ අපකීර්තිමත් චර්යාව හෝ වෘත්තීය යුතුකම්වලට අදාළ පැහැර හැරීම හෝ අයෝග්‍ය තත්ත්වය පිළිබඳව වෘත්තිකයා නිවැරදිකරු වන බවට,

(3) ඉවත ලන ලද චෝදනාවක් යනුවෙන් (1) වැනි ඡේදයෙහි සඳහන් කරන ලද්දේ ප්‍රස්ථාරයේ හැටියට වෘත්තිකයා වෘත්තියෙහි යෙදීමට නුසුදුසු බවට පත් වන වෘත්තීය කරුණක් පිළිබඳ අපකීර්තිමත් චර්යාව හෝ වෘත්තීය යුතුකම් පැහැර හැරීම හෝ අයෝග්‍යතාවය පිළිබඳ චෝදනාවකට වෘත්තිකයා නිවැරදිකරු වන බවට වෘත්තීය චර්යා කමිටුව දැනටමත් තීරණයක් සටහන් කර ගෙන ඇති සඳහනක් ලෙස තේරුම් ගත යුතු ය.

(4) වෘත්තීය චර්යා කමිටුව සෑහීමට පත්වන පරිදි කිසිම චෝදනාවක් ඔප්පු වී නැති බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කර ඇති විට, වැරදිකරු නොවන බව දැක්වෙන තීරණයක් වෘත්තීය චර්යා කමිටුව විසින් සටහන් කර ගත යුතු අතර, වෘත්තීය චර්යා කමිටුව සුදුසුයයි සිතන ආකාරයට වෘත්තීය චර්යා කමිටුවේ තීරණය සභාපතිවරයා විසින් නිවේදනය කළ යුතු ය.

(5) කිසියම් චෝදනාවක් ඔප්පු වී ඇති බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කළ විට ඊට හේතු එම කමිටුව විසින් දක්වා සිටිය යුතු ය. ඒ අනුව වෘත්තිකයා වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට අදහස් කරන්නේ ද යන වග සභාපතිවරයා වෘත්තිකයාගෙන් ඇසිය යුතු අතර, එසේ කිරීමට වෘත්තිකයා කැමති වන්නේ නම් ලිහිල් කිරීමක් වශයෙන් වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට හැකි අතර, ආඥාපනතේ 25(1)(අ) වගන්තිය යටතේ ක්‍රියා කිරීම සඳහා වෘත්තීය චර්යා කමිටුව විසින් නියෝගයක් නිකුත් නොකළ යුත්තේ මන්ද යන වග සම්බන්ධයෙන් හේතු දැක්විය යුතු ය. වෘත්තිකයා තමාගේ යහපත් චරිතයට අදාළ සාක්ෂි ද ගෙන හැර දැක්විය යුතු ය.

19. වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට සහ ඉහත සඳහන් පරිදි සාක්ෂි ගෙන හැර දැක්වීමට වෘත්තිකයාට අවස්ථාවක් ලබා දීමෙන් පසු එම අවස්ථාව ඔහු ලබා ගන්නේ නම්, ඔහුගේ ඇමතීම හෝ සාක්ෂිදීම අවසන්වීමෙන් පසු, ආඥාපනතේ 25(1) වැනි වගන්තිය යටතේ ක්‍රියා කිරීම සඳහා වන වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල් දැමිය යුතුද යන වග සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුව සලකා බලා තීරණය කළ යුතු අතර, වෘත්තීය චර්යා කමිටුව එසේ කිරීමට තීරණය කළහොත්, වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන ආකාරයට වෘත්තීය චර්යා කමිටුවේ අනාගත රැස්වීම දක්වා වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල් තැබිය යුතු අතර, වෘත්තීය චර්යා කමිටුව යෝග්‍ය යයි සිතන ආකාරයට වෘත්තීය චර්යා කමිටුවේ තීරණය සභාපතිවරයා විසින් නිවේදනය කළ යුතු ය.

20. වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල් නොදැමිය යුතු බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන්නේ නම් වෘත්තීය චර්යා කමිටුව යෝග්‍ය යයි සිතන ආකාරයට වෘත්තීය චර්යා කමිටුවේ තීරණය සභාපතිවරයා විසින් නොපමාව නිවේදනය කළ යුතු ය.

21. ඊට පසුව වෘත්තීය චර්යා කමිටුව සිය තීරණය ගැන සභාවට දැන්විය යුතු ය. එවැනි තීරණයක් ලැබුණ විට එම තීරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන ආකාරයට පියවර ගන්නා ලෙස සභාව ලේඛකාධිකාරීවරයා ට නියම කළ යුතු ය.

**(ඇ) වෘත්තිකයාගේ ඩිප්ලෝමාව, උපාධිය ආදිය අහිමි කිරීමට අදාළ අවස්ථා :**

22. පැමිණිල්ල හෝ වාර්තාව අදාළ වන :–

(අ) වෘත්තිකයා, වෛද්‍ය වෘත්තිකයෙක් වන විට, ඔහු වෛද්‍ය වෘත්තිකයෙකු වශයෙන් ලියා පදිංචි වීමට සුදුසුකම් ලැබූ කිසියම් ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ සහතිකයක් අහිමි කිරීම,

(ආ) වෘත්තිකයා, දන්ත වෛද්‍යවරයෙක් වන විට, ඔහු දන්ත වෛද්‍යවරයෙකු වශයෙන් ලියා පදිංචි වීමට සුදුසුකම් ලැබූ කිසියම් ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ සහතිකයක් අහිමි කිරීම,

(ඇ) වෘත්තිකයා, ඇපොතිකරිවරයෙක් වන විට, ඔහු ආඥාපනතේ 41 වැනි වගන්තිය යටතේ වෛද්‍ය කර්මයෙහි සහ ශල්‍ය වෛද්‍ය කර්මයෙහි යෙදීමට හිමිකම් ලබමින් ඇපොතිකරිවරයෙකු වශයෙන් ලියා පදිංචි වීමට සුදුසුකම් ලැබූ කිසියම් සහතිකයක් අහිමි කිරීම,

(ඈ) වෘත්තිකයා, පවුල් සෞඛ්‍ය සේවිකාවක් වන විට, ඇය පවුල් සෞඛ්‍ය සේවිකාවක් වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබූ කිසියම් ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ සහතිකයක් අහිමි කිරීම.

(ඉ) වෘත්තිකයා, ඖෂධවේදියෙකු වන විට, ඔහු ඖෂධවේදියෙකු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබූ කිසියම් ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ සහතිකයක් අහිමි කිරීම.

(ඊ) වෘත්තිකයා අතුරු වෛද්‍ය සහකාරයෙකු වන විට, ඔහු අතුරු වෛද්‍ය සහකාරයෙකු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබූ කිසියම් ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ සහතිකයක් අහිමි කිරීම,

(උ) වෘත්තිකයා, හෙදවරයෙක්/හෙදියක් වන විට, ඔහු/ඇය හෙදවරයෙකු/හෙදියක වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබූ කිසියම් ඩිප්ලෝමාවක්, උපාධියක් හෝ සහතිකයක් අහිමි කිරීම.

එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් විභාග කිරීමේදී පිළිපැදිය යුතු ක්‍රියා පරිපාටිය 14 සහ 15 වැනි නියෝගවල විධිවිධානවලට හානියක් නොවනා කාරයෙන් පහත සඳහන් පරිදි විය යුතු ය:-

(1) වෘත්තිකයාට විරුද්ධව නගා ඇති චෝදනාව සම්බන්ධයෙන් නීතිඥවරයා සාක්ෂි ගෙන හැර දැක්විය යුතු ය.

(2) නීතිඥවරයා විසින් සාක්ෂි ගෙනහැර නොදක්වන්නේ නම්, එවිට චෝදනාව ඔප්පු කර නැති බව සභාපතිවරයා නිවේදනය කළ යුතු ය.

(3) කිසියම් සාක්ෂියක් ගෙනහැර දක්වන්නේ නම්, සහ වෘත්තිකයා පරීක්ෂණයේදී පෙනී සිටින්නේ නම් චෝදනාව අසත්‍ය බව ඔප්පු කිරීම සඳහා සාක්ෂි ගෙනහැර දැක්වීමට වෘත්තිකයාට හැකි අතර, ඔහුගේ සාක්ෂිය ආරම්භවීමට පෙර හෝ අවසන් වූ පසුව හෝ වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට ඔහුට හැකි ය.

(4) ඉහත සඳහන් පරිදි වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට සහ සාක්ෂි ගෙනහැර දැක්වීමට වෘත්තිකයාට අවස්ථාවක් ලබාදුන් පසු, ඔහු එම අවස්ථාව ප්‍රයෝජනයට ගන්නේ නම්, ඔහුගේ සාක්ෂියක් හෝ ඇමතීමක් ඇතොත් එය අවසන්වීමෙන් පසු චෝදනාව ඔප්පු කර ඇද්ද යන වග සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුව සළකා බලා තීරණයක් ගත යුතු අතර, එසේ නම්, ආඥාපනතේ 25(1)(අ) වගන්තිය යටතේ ක්‍රියා කිරීම සඳහා වන වෘත්තීය චර්යා කමිටුවේ තීරණය වෘත්තීය චර්යා කමිටුවේ අනාගත රැස්වීමකට කල්දැමිය යුතු ද යන වග වෘත්තීය චර්යා කමිටුව සළකා බලා තීරණයක් ගත යුතු ය.

(5) චෝදනාව ඔප්පු වී ඇති බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන්නේ නම් සහ වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල්දැමිය යුතු යයි තවදුරටත් තීරණය කරන්නේ නම්, එවිට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරනු ලැබිය හැකි ආකාරයට වෘත්තීය චර්යා කමිටුවේ අනාගත රැස්වීමක් දක්වා වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල්දැමිය යුතු ය.

(6) සිය තීරණය කල් නොදැමීමට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන්නේ නම්, එවිට වෘත්තීය චර්යා කමිටුව යෝග්‍යයයි සිතන ආකාරයට ඊට හේතු දක්වමින් වෘත්තීය චර්යා කමිටුවේ තීරණය සභාපතිවරයා විසින් නිවේදනය කළ යුතු ය.

(7) චෝදනාව ඔප්පු වී නැති බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන්නේ නම්, ඒ අනුව සභාපතිවරයා විසින් වෘත්තීය චර්යා කමිටුවේ තීරණය නිවේදනය කළ යුතු ය.

(8) ඊට පසුව, සිය තීරණය ගැන වෘත්තීය චර්යා කමිටුව, සභාවට දැනුම් දිය යුතු ය. එවැනි තීරණයක් ලැබුණ විට, එකී තීරණය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස සභාව ලේඛකාධිකාරීවරයාට නියම කළ යුතු ය.

වෘත්තිකයකු වරදකරු කිරීමට අදාළ වන අවස්ථා

23. පැමිණිල්ල හෝ වාර්තාව, වෘත්තිකයෙකු අධිකරණයක් මගින් වරදකරුවෙකු කිරීමකට අදාළ වන්නේ නම්, 14 සහ 15 වැනි නියෝගවල විධි විධානවලට හානියක් නොවනාකාරයෙන් පහත සඳහන් ක්‍රියා පරිපාටිය අනුගමනය කළ යුතු ය.

(1) වරදකරුවීම පිළිබඳ සාක්ෂි නීතිඥවරයා ගෙනහැර දැක්විය යුතු අතර, වරදකරුවීමට හේතුභූත වූ කරුණු පිළිබඳ සාක්ෂිද ගෙනහැර දැක්විය යුතු ය. නීතිඥවරයා විසින් එසේ සාක්ෂි ගෙනහැර නොදක්වන්නේ නම්, වරදකරුවීම ඔප්පු කර නොමැති බැව් සභාපතිවරයා නිවේදනය කළ යුතු ය.

(2) (අ) එසේ සාක්ෂි ගෙනහැර දැක්වුවහොත් වෘත්තිකයා වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට අදහස් කරන්නේ දැයි සභාපතිවරයා ඔහුගෙන් විමසිය යුතු අතර, එසේ කිරීමට ඔහු කැමති වන්නේ නම්, ඔහු වරදකරු කිරීම සඳහා සිදු කළැයි කියනු ලබන වරද නිසා ඔහු වෘත්තියේ යෙදීමට නුසුදුසු බව පෙනී යන්නේද යන වග සහ දඬුවම ලිහිල් කිරීමේ මගක් වශයෙන්, ආඥාපනතේ 25(1)(අ) වගන්තිය යටතේ ක්‍රියා කිරීම සඳහා වෘත්තීය චර්යා කමිටුව ලේඛකාධිකාරීවරයාට නියම නොකළ යුත්තේ මන්ද යන වග සම්බන්ධයෙන් හේතු දැක්වීම හෝ කෙසේවුවත් වහාම තීරණයක් නොගත යුතු බවට හෝ ඔහුට විරුද්ධව නගා ඇති චෝදනාව හෝ චෝදනා සම්බන්ධයෙන් ඔහු අදහස් කරන වෙනත් ඕනෑම කරුණක් ඉදිරිපත් කිරීම සඳහා වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට ඔහුට හැකි ය.

(ආ). (අ) ඡෙදය යටතේ එක් ඇමතීමක් පමණක් කිරීම සඳහා අවසර දිය යුතු අතර, වෘත්තිකයා සාක්ෂි ගෙනහැර දක්වන්නේ නම්, එම ඇමතීම කළ යුත්තේ එවැනි සාක්ෂියක් ආරම්භ වීමට පෙර හෝ එය අවසන් වූ පසුව හෝ විය යුතු ය.

(3) ඉහත සඳහන් පරිදි වෘත්තීය චර්යා කමිටුව ඇමතීමට සහ සාක්ෂි ගෙනහැර දැක්වීමට වෘත්තිකයාට අවස්ථාවක් ලබා දුන් විට ඔහුගේ ඇමතීම හෝ සාක්ෂිදීම අවසන් කිරීමෙන් පසු ඔහු එම අවස්ථාව ලබා ගන්නේ නම්, වරදකරු කිරීම ඔප්පු කර ඇද්ද යන වග සහ එසේ නම් ආඥාපනතේ 25(1)(අ) වගන්තිය යටතේ ක්‍රියා කිරීම සඳහා වන වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල්දැමිය යුතුද යන වග සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුව සළකා බැලිය යුතු ය.

(4) වෘත්තීය චර්යා කමිටුවේ අනාගත රැස්වීමක් දක්වා වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල්තැබිය යුතු බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන්නේ නම්, වෘත්තීය චර්යා කමිටුව සුදුසුයයි තීරණය කරනු ලැබිය හැකි වෘත්තීය චර්යා කමිටුවේ අනාගත රැස්වීමක් දක්වා වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල් දැමිය යුතු ය.

(5) වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල් නොදැමිය යුතු බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන්නේ නම්, වෘත්තීය චර්යා කමිටුව යෝග්‍ය යයි සිතන ආකාරයට වෘත්තීය චර්යා කමිටුවේ තීරණය සභාපතිවරයා විසින් නිවේදනය කළ යුතු ය.

(6) ඊට පසුව, වෘත්තීය චර්යා කමිටුව තීරණය ගැන සභාවට දැන්විය යුතු ය. එවැනි තීරණයක් ලැබුණ විට, එම තීරණය සම්බන්ධයෙන් අවශ්‍ය යැයි සලකනු ලබන පියවර ගන්නා ලෙස සභාව, ලේඛකාධිකාරීවරයාට නියම කළ යුතු ය.

## III කොටස

### වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල් දැමූ විට

24. (1) මෙම නියෝගවල පෙර සඳහන් විධිවිධාන කිසිවක් යටතේ වෘත්තීය චර්යා කමිටුවේ (මෙහි මින්මතු "ඊළඟ රැස්වීම" යනුවෙන් හඳුන්වනු ලබන) අනාගත රැස්වීමකට වෘත්තීය චර්යා කමිටුවේ තීරණයක් කල් දැමූ විට, එකී රැස්වීම පැවැත්වීමට නියමිත දිනයට සති හයකට නොඅඩු කාලයකට පෙර –

(අ) ඊළඟ රැස්වීම සඳහා නියමිත දිනය, වේලාව සහ ස්ථානය නිශ්චිතව දක්වමින් ; සහ

(ආ) වෘත්තිකයා ඊට සහභාගි විය යුතු බව දක්වමින්, වෘත්තිකයාට නිවේදනයක් භාරදිය යුතු ය.

(2) සභාපතිවරයා වෙනත් ආකාරයකින් නියම කළහොත් මිස, (1) ඡේදය යටතේ වන නිවේදනයකින් වෘත්තිකයාගේ චරිතය ගැන කරුණු දැනගැනීම සඳහා විමසිය හැකි නියමිත පුද්ගලයින් සංඛ්‍යාවකගේ නම් සහ ලිපිනයන් වෘත්තිකයා විසින් ලේඛකාධිකාරීවරයාට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

(3) එවැනි සෑම නිවේදනයක්ම වෘත්තිකයා හට ලියාපදිංචි ලේඛනයේ දැක්වෙන ඔහුගේ ලිපිනයට හෝ අවසන් වරට දැනගත් ඔහුගේ ලිපිනය, ලියාපදිංචි ලේඛනයේ සඳහන් ලිපිනයට වඩා වෙනස් වන්නේ නම් හා එම ලිපිනයට දැනුම්දීම වඩා සඵලවේයයි නීතිඥයාට පෙනී යන්නේ නම් එම ලිපිනයට හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

(4) පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති සෑම අවස්ථාවකදීම එකී නිවේදනයේ පිටපතක් පැමිණිලිකරුට භාරදිය යුතු ය.

25. (1) 24 වන නියෝගය යටතේ වෘත්තිකයකුට නිවේදනයක් භාරදීමෙන් පසු, ඔහුගේ නඩුව නැවත සළකා බැලීම සඳහා වන රැස්වීම නියමකර ඇති දිනට සති 3 කට නොඅඩු කාලයකට ප්‍රථම:–

(අ) වෘත්තිකයාගේ නඩුව නැවත සළකා බැලීමේදී ඒ සඳහා නඩුව ප්‍රථමයෙන් ඇසීමෙන් පසු හටගත් කරුණු ඇත්නම් ඒවා වෘත්තීය චර්යා කමිටුවට ඉදිරිපත් කිරීමට ඔහු අදහස් කරන්නේ නම් එම කරුණු ඇතුළත් ඔහුගේ ප්‍රකාශයක් හෝ දිවුරුම් පෙත්සමක් සහ,

(ආ) ඔහුගේ නඩුව ඇසූ දින සිට ඔහුගේ චර්යාව හෝ තත්ත්වය දැක්වෙන ඔහු විසින් විශ්වාසය තැබීමට බලාපොරොත්තු ඕනෑම ප්‍රකාශයක හෝ දිවුරුම් පෙත්සමක පිටපතක් ලේඛකාධිකාරීවරයා හට යැවිය යුතු ය.

(2) පැමිණිල්ලක් ඇති ඕනෑම නඩුවක, (1) වන ඡේදයේ සඳහන් ආකාරයට වෘත්තිකයා විසින් නීතිඥයා හට යවන ලද කුමන හෝ ප්‍රකාශයක හෝ දිවුරුම් පෙත්සමක පිටපතක් නීතිඥයා විසින් පැමිණිලිකරුට ද යැවිය යුතු අතර, වෘත්තිකයා විසින් එසේ යවන ලද ප්‍රකාශයේ හෝ දිවුරුම් පෙත්සමේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රකාශයක් හෝ දිවුරුම් පෙත්සමක් පැමිණිලිකරු හට තමා විසින්ම හෝ වෙනත් අයෙකුගේ මාර්ගයෙන් නීතිඥයා වෙත යැවිය හැකි ය.

26. මූලික විභාග කිරීමෙන් පසුව, වෘත්තිකයාට විරුද්ධව අළුත් පැමිණිල්ලක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන්නේ නම් හා එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් ඊළඟ රැස්වීමේදී විභාග කිරීම සඳහා යථා පරිදි වෘත්තීය චර්යා කමිටුවට ඉදිරිපත් කර තිබේ නම් වෘත්තීය චර්යා කමිටුව විසින් ප්‍රථමයෙන් එම පැමිණිල්ල හෝ වාර්තාව ගැන විභාග කළ යුතු අතර, එම විභාගයේදී වෘත්තිකයාට විරුද්ධව නගා ඇති චෝදනා ඔහු පිළිගනු ලබන්නේ නම් හෝ චෝදනාව ඔප්පු වී ඇති බවට වෘත්තීය චර්යා කමිටුව තීරණය කරන්නේ නම්, එවිට මෙම නියෝගවල පූර්ව විධිවිධානවලට කිසියම් පටහැනිවීමක් සිදුවුව ද එම චෝදනාව පිළිබඳ තීරණය වෘත්තීය චර්යා කමිටුව විසින් ඊළඟ රැස්වීමේදී ගැනීමට කල් තබන ලද චෝදනාවක් ලෙස සලකා ක්‍රියා කළ යුතු ය.

27. ඊළඟ රැස්වීමේ දී සභාපති විසින් වෘත්තීය චර්යා කමිටුවේ දැන ගැනීම සඳහා නඩුවේ වර්තමාන තත්ත්වය ප්‍රකාශකරන ලෙසට නීතිඥවරයාට ආරාධනා කළ යුතු අතර, ඊට පසු වෘත්තීය චර්යා කමිටුවට –

(අ) නඩුවේ කාර්ය සඳහා වෙනත් පාර්ශ්වයන් විභාගයට භාජනය කිරීම,

හෝ

(ආ) වෘත්තීය චර්යා කමිටුව සුදුසුයයි සිතන ආකාරයට, නඩුව සම්බන්ධයෙන් හෝ නඩුව අවසන් වරට විභාග කිරීමෙන් පසු වෛද්‍ය වෘත්තිකයාගේ හැසිරීම සම්බන්ධව හෝ අදාළ වාචික හෝ ලිඛිත සාක්ෂි තව දුරටත් ලබා ගැනීම කළ හැකි ය.

28. ඊට පසුව වෘත්තීය චර්යා කමිටුව යෝග්‍ය යැයි සිතන ආකාරයට ආඥාපනතේ 25(1)(අ) වගන්තිය යටතේ ක්‍රියා කිරීමට නියෝග කළ යුතු ද නැද්ද යන වග වෘත්තීය චර්යා කමිටුව විසින් සළකා බලා තීරණය කළ යුතු ය.

## IV කොටස

### ලියාපදිංචි ලේඛනයට නම් යළි ඇතුළත් කිරීම

29. වෘත්තිකයෙකුගේ නම ආඥා පනතේ 25(1)(අ) වගන්තිය යටතේ අදාළ ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමෙන් පසු එම නම ලියාපදිංචි ලේඛනයේ නැවත ඇතුළත් කිරීමට අයදුම් කරනු ලබන විටක එම අයදුම්පත සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියා පරිපාටිය අදාළ විය යුතු ය:–

(1) අයදුම්පත සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුවට කරුණු ඉදිරිපත් කිරීම සඳහා අවස්ථාවක් වෘත්තීය චර්යා කමිටුව විසින් අයදුම්කරුට ලබාදිය යුතු ය.

(2) අයදුම්පත සම්බන්ධයෙන් තීරණයකට එළඹීමට පෙර වෘත්තීය චර්යා කමිටුව අවශ්‍ය යැයි සලකනු ලබන ආකාරයට, අයදුම්කරුගේ අනන්‍යතාවය හෝ ඔහුගේ නම ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමෙන් පසු ඔහුගේ චර්යාව පිළිබඳ එවැනි දිවුරුම් පෙත්සමක් හෝ සහතිකයක් හෝ වෘත්තීය චර්යා කමිටුව අවශ්‍ය යයි සලකන ආකාරයට වාචික සාක්ෂි වෘත්තීය චර්යා කමිටුව ඉදිරියේ ඉදිරිපත් කරන ලෙසට වෘත්තීය චර්යා කමිටුව විසින් ඉල්ලා සිටීමට පිළිවන.

(3) වෘත්තීය චර්යා කමිටුව සුදුසු යැයි සිතන්නේ නම්, අයදුම්කරුගේ නම ලියාපදිංචි ලේඛනයේ ඇතුළත් කිරීමට ඉවහල් වූ සුදුසුකම් ලබා දුන් ඩිප්ලෝමාව, උපාධිය හෝ සහතිකය ප්‍රදානය කළ ඕනෑම අයකුට හෝ අදාළ ලේඛනයෙන් අයදුම්කරුගේ නම ඉවත් කිරීමට හේතු වූ පැමිණිල්ල ඉදිරිපත් කළ ඕනෑම අයෙකු හට හෝ අයදුම් පත සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුව ඉදිරියේ කරුණු ඉදිරිපත්කර සිටීමට අවස්ථාවක් ලබා දීමට වෘත්තීය චර්යා කමිටුවට පිළිවන.

(4) මෙම නියෝගවල පෙර සඳහන් විධිවිධානවලට යටත්ව, ලියාපදිංචි කිරීමේ ලේඛනයක නමක් යළි ඇතුළත් කිරීමේදී වෘත්තීය චර්යා කමිටුව විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත වෘත්තීය චර්යා කමිටුව විසින් තීරණය කරනු ලබන ආකාරයට විය යුතුය.

30. ආඥාපනතේ 25(1)(ආ) යටතේ ලියාපදිංචි කිරීමේ ලේඛනයක නමක් යළි ඇතුළත් කිරීම සඳහා වන සෑම අයදුම්පතක්ම එම අයදුම්පත ඉදිරිපත් කිරීමට අදාළ වූ හේතු සඳහන් කරමින් ලේඛකාධිකාරීවරයා අමතන ලද ලිඛිත ප්‍රකාශයක් මගින් කළ යුතු ය.

## V කොටස

### පොදු

31. වෘත්තිකයන් දෙදෙනෙකුට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට විරුද්ධව ඇති චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම වැළැක්වෙන ආකාරයේ කිසිවක් මෙම නියෝගවලින් අදහස් නොකෙරෙන අතර, එවැනි පරීක්ෂණයක් පවත්වනු ලබන විටක අවශ්‍ය අනුයෝජනයන් සහිතව සහ වෘත්තිකයින් කිහිප දෙනෙකු සම්බන්ධයෙන් මෙම රෙගුලාසිවලින් ඕනෑම එකක් යටතේ සටහන් කර ගනු ලබන කාර්යයන් තුළින් ගනු ලබන නියෝගය සම්බන්ධව වෘත්තීය චර්යා කමිටුව විසින් පනවනු ලබන නිශ්චයන්ට යටත්ව 14 සිට 28 දක්වා නියෝග (දෙකම ඇතුළත්ව) අදාළ විය යුතු ය.

32. වෘත්තිකයකුට විරුද්ධව එක චෝදනාවකට වැඩි චෝදනා ගණනක් සම්බන්ධයෙන් මෙම නියෝග යටතේ පරීක්ෂණයක් පවත්වනු ලබන විටක, හා එම චෝදනා අංක 16, 22, 23 යන රෙගුලාසි හෝ එයින් ඕනෑම දෙකක් යටතට ගැනෙන විට, පරීක්ෂණයේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත නඩුවේ කරුණුවලින් අවශ්‍ය වන පරිදි වෘත්තීය චර්යා කමිටුව විසින් පනවනු ලබන ආකාරයකට විය යුතු ය.

33. සාධාරණත්වයේ යහපත පිණිස හෝ වෙනත් කුමන හෝ විශේෂ කරුණක් හේතු කොට නඩුවේ කුමන හෝ කාර්යයකින් හෝ එහි කොටසකින් මහජනයා ඉවත් කළ යුතු යැයි වෘත්තීය චර්යා කමිටුව තීරණය කරනු ලබන්නේ නම්, එසේ මහජනයා ඉවත් වී සිටිය යුතු යැයි වෘත්තීය චර්යා කමිටුවට තීරණය කිරීමට පිළිවන.

34. (1) (2) වන ඡේදයේ සඳහන් විධිවිධානවලට යටත්ව මෙම නියෝගවල 4 වන උපලේඛනයේ නියම වශයෙන් සඳහන් කර ඇති කුමන හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුව විසින් සලකා බලනු ලබන විටක, වෘත්තිකයා හැර අනෙකුත් සියළුම පාර්ශ්වයන් හා මහජනතාව බැහැර කළ යුතු යැයි නියම කිරීමට වෘත්තීය චර්යා කමිටුවට පිළිවන.

(2) මෙම නියෝගවල (අ) වන ඡේදය යටතේ වූ විධානයක්, මෙම නියෝගවලින් යම් නියෝගයක් අනුව ක්‍රියා කරමින් චර්යා කමිටුව විසින් යම් තීරණයක් ප්‍රකාශයට පත් කිරීමකට අදාළ නොවිය යුතු ය.

35. 33 සහ 34 යන නියෝගවල විධිවිධානවලට යටත්ව වෘත්තීය චර්යා කමිටුවේ සියළුම කාර්යයන් ප්‍රසිද්ධියේ පැවැත්විය යුතු ය.

36. (1) මෙම නියෝග යටතේ වෘත්තිකයකුට විරුද්ධව පවත්වනු ලබන කුමන හෝ කාර්යයකදී, සාක්ෂි මෙහෙයවමින් වෘත්තිකයාට විරුද්ධව නඩුව ඉදිරිපත් කරනු ලබන නීතිඥවරයා 37 සහ 38 යන නියෝගවල කාර්යයන් සඳහා පාර්ශ්වකරුවකු ලෙස සැලකිය යුතු ය.

(2) 27 වැනි නියෝගය අනුව නඩුවේ තත්ත්වය ප්‍රකාශ කිරීම හැරුණ විට, නඩුව විභාග කිරීමේදී වෙනත් අයුරකින් නීතිඥවරයා විසින් ක්‍රියා කළ යුතු වන හෝ ඒ සඳහා ඔහුට බලය පවරා ඇති නඩුවක් නම් පමණක් 34 වැනි නියෝගයේ කාර්යයන් සඳහා ඔහු පාර්ශ්වකරුවෙකු වශයෙන් සැලකිය යුතු ය.

37. කිසියම් පාර්ශ්වයක් විසින් සාක්ෂිකරුවකු ඉදිරිපත් කරනු ලැබූ විටක ප්‍රථමයෙන් ඔහු ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් ප්‍රශ්න කරනු ලැබිය යුතු අතර, අනතුරුව අනෙක් පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න ඇසිය යුතු ය. ඊට පසු ඔහු ඉදිරිපත් කරනු ලබන පාර්ශ්වය විසින් යළි ප්‍රශ්න කළ යුතු ය. හරස් ප්‍රශ්න ඇසීමට යටත් වීම ප්‍රතික්ෂේප කරන හෝ ඉදිරිපත් නොකරන ලද ලියවිල්ලක් සම්බන්ධව සාක්ෂිකරුවෙක් දෙන ඕනෑම සාක්ෂියක් ප්‍රතික්ෂේප කිරීමට වෘත්තීය චර්යා කමිටුවට හැකි ය.

38. වෘත්තීය චර්යා කමිටුවේ සාමාජිකයින්ට එහි සභාපතිගේ මාර්ගයෙන් නඩුවේ කාර්යයන් සඳහා ඕනෑම සාක්ෂිකරුවෙකුගෙන් හෝ පාර්ශ්වකරුවකුගෙන් ප්‍රශ්න ඇසීමට පිළිවන.

39. වෘත්තීය චර්යා කමිටුව අධිකරණයකදී මෙන් වාචික හෝ අනෙක් සාක්ෂි ලබා ගැනීමට පිළිවන.

40. වෘත්තීය චර්යා කමිටුව විසින් කුමන හෝ ප්‍රශ්නයක් පිළිබඳව තීරණය කිරීමේදී, ඡන්දය විමසීම සම්බන්ධයෙන් පහත සඳහන් විධිවිධාන බල පැවැත්විය යුතුය:-

(1) අත් එසවීමෙන් තමන්ගේ ඡන්දය ප්‍රකාශ කරන ලෙස සභාපතිවරයා විසින් සාමාජිකයින්ගෙන් ඉල්ලා සිටිය යුතු අතර, ප්‍රස්ථාවයේ හැටියට ප්‍රශ්නය පක්ෂව හෝ විපක්ෂව තීරණය වී ඇති බවට ප්‍රකාශ කළ යුතු ය.

(2) මේ ආකාරයට ප්‍රකාශ කරනු ලැබූ ප්‍රතිඵල සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුවේ කිසියම් සාමාජිකයෙක් අභියෝගයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් සභාපති විසින් –

(අ) එක් එක් සාමාජිකයා හට වෙන වෙනම ඡන්දය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටීම.

(ආ) තමාගේම ඡන්දය ප්‍රකාශ කිරීම,

සහ

(ඇ) වෘත්තීය චර්යා කමිටුවේ සාමාජිකයින්ගෙන් එක් එක් සාමාජිකයා ඡන්දය ප්‍රකාශ කළ ආකාරය සහ ඡන්දයේ ප්‍රතිඵල ප්‍රකාශ කළ යුතුය.

(3) මෙම නියෝගවල 4 වන උපලේඛනයේ නිශ්චිත වශයෙන් විස්තර කර ඇති කුමන හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ප්‍රකාශ කරනු ලබන ඡන්දය එක සමාන වන විට, එවැනි ප්‍රශ්නයක් වෘත්තිකයා හට පක්ෂව විසඳී ඇති බවට අදහස් කළ යුතු ය.

(4) මෙම නියෝගයේ කාර්යයන් සඳහා "වෘත්තිකයා" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 29 නියෝගය යටතේ ඔහුගේ නම ප්‍රතිෂ්ඨාපනය කර ගැනීම සඳහා අයදුම් පතක් ඉදිරිපත් කර ඇති කවර හෝ පුද්ගලයෙකි.

41. ආඥා පනතේ 25 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව කිසියම් පාර්ශ්වයක්, සංයුක්ත සමාගමක් හෝ අසංයුක්ත සමාගමක් වන විට මෙම කාර්යය සඳහා නිසියාකාරව පත් කළ නිලධාරියෙකු විසින් හෝ නීතිඥවරයෙකු විසින් පෙනී සිටිනු ලැබිය හැකි අතර, කිසියම් පාර්ශ්වයක් තනි පුද්ගලයෙකු වන විට තමාම හෝ නීතිඥවරයෙකු හෝ ඔහු සාමාජිකයෙකු වන කිසියම් සංවිධානයක ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඔහුගේ පවුලේ සාමාජිකයෙකු විසින් හෝ පෙනී සිටිනු ලැබිය හැකි ය.

42. පරීක්ෂණයේ කිසියම් පාර්ශ්වයක් විසින් එම පාර්ශ්වය වෙනුවෙන් අයදුම් පතක් ලේඛකාධිකාරීවරයාට ඉදිරිපත් කොට, වෘත්තීය චර්යා කමිටුව විසින් එම පාර්ශ්වය වෙනුවෙන් නියම කරනු ලබන කිසියම් ගාස්තුවක් ගෙවීමෙන් පසු එම පාර්ශ්වය පැමිණ සිටීමට හිමිකම් ලැබූ නඩු කාර්යයෙහි ඇති කුමන හෝ කොටසක ලඝු ලේඛන සටහන්වල පිටපත් සැපයිය යුතු ය.

43. නීතිඥවරයා හෝ නීති උපදේශකවරයා විසින් කුමන හෝ පරීක්ෂණයකදී වෘත්තීය චර්යා කමිටුව ඉදිරියේ සාක්ෂියක් වශයෙන් ඉදිරිපත් කිරීම සඳහා අපේක්ෂිත එක් එක් ලියවිල්ලේ පිටපතක් බැගින් වෘත්තීය චර්යා කමිටුවට ඉදිරිපත් කළ යුතු ය.

44. කුමන හෝ පරීක්ෂණයක පාර්ශ්වකරුවන්, නීතිඥවරයෙකු හෝ නීති උපදේශකවරයෙකු මගින් නියෝජනය කරනු ලබන විටක, මෙම නියෝගවල එවැනි පාර්ශ්වයක් ගැන සඳහන් කරනු ලබන අවස්ථාවලදී වගන්තිවල යෙදෙන ආකාරය අනුව එවැනි පාර්ශ්වයකට නීතිඥවරයෙකු හෝ නීති උපදේශකවරයෙකු හෝ ඇතුලත් වූවා සේ සැලකිය යුතු ය.

45. සභාපති හෝ සභාපති විසින් ඉටු කළ යුතු බවට මෙම නියෝගවලින් බලය පවරනු ලැබූ හෝ අවශ්‍ය වී ඇති කුමන හෝ කරුණක් ඉටු කිරීමට ප්‍රස්ථාවයේ හැටියට සභාපති හෝ උප සභාපති නොමැති විටක හෝ සභාපතිට හෝ උප සභාපතිට නොහැකි වූ විටක ඒ වෙනුවට සභාව විසින් බලය පවරනු ලැබූ වෙනත් කුමන හෝ සාමාජිකයකු හට හැකි ය.

46. මෙම නියෝග යටතේ ලියාපදිංචි තැපැලෙන් යැවීමට නියම කරන ලද නිවේදනයක් හැර අන් කවර හෝ නිවේදනයක් සාමාන්‍ය තැපැලෙන් යැවීමට හෝ පුද්ගලිකව භාරදීම හෝ කළ හැකි ය.

47. මෙම නියෝග යටතේ පවත්වනු ලබන කුමන හෝ නඩු කාර්යයන් පිළිබඳව ලඝුලේඛන සටහන් ගැනීම සඳහා ලඝුලේඛකයකු පත් කිරීමට වෘත්තීය චර්යා කමිටුවට පිළිවන.

## VI කොටස

### අවලංගු කිරීම්

48. 1959 නොවැම්බර් මස අංක 11980 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාපනතේ 66 වන වගන්තිය යටතේ පනවන ලද නියෝග මෙයින් අවලංගු කරනු ලැබේ.

49. (1) මෙම නියෝගවල පදාර්ථය වෙනත් ආකාරයකින් නොදක්වෙන විටක "චර්යාව පිළිබඳ නඩුව" යනුවෙන් හඳුන්වනු ලබන්නේ වෘත්තිකයෙකු–

(අ) වෛද්‍ය වෘත්තිකයකු හෝ දන්ත වෛද්‍යවරයකු වශයෙන් වෘත්තීමය වශයෙන් අපකීර්තිමත් හැසිරීම් සම්බන්ධයෙන් වරදකරු වීම හෝ

(ආ) සහකාර වෛද්‍ය වෘත්තිකයකු වී සිටියදී අදක්ෂතාවය හෝ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් සැළකිල්ලක් නොදැක්වීම හෝ 41 වන වගන්තියේ නියම වශයෙන් විස්තර කර ඇති සහකාර වෛද්‍යවරයෙකු හෝ එහි ඖෂධ සංයෝජකවරයෙකු වී සිටියදී වෛද්‍ය කර්මයෙහි හෝ ශල්‍ය වෛද්‍ය කර්මයෙහි යෙදීමට ඔහු නුසුදුසු වන වරදකට වැරදිකරු වීම හෝ

(ඇ) ඖෂධවේදියකු, පවුල් සෞඛ්‍ය සේවිකාවක හෝ හෙදියක වශයෙන් ඔහුගේ හෝ ඇයගේ වෘත්තීමය රාජකාරි කටයුතුවල නොසැළකිලිමත්කමක් හෝ අයෝග්‍යතාවයක් පෙන්නුම් කිරීම

(ඈ) අතුරු වෛද්‍ය සහකාරවරයෙකු වශයෙන්, ඔහුගේ හෝ ඇයගේ වෘත්තීමය රාජකාරි සම්බන්ධයෙන් නොසැළකිලිමත්කමක් හෝ අදක්ෂතාවයක් පෙන්නුම් කිරීම.

ප්‍රස්ථාවයේ හැටියට ප්‍රාථමික කාර්ය කමිටුවක වෘත්තීය චර්යා කමිටුවක රැස්වීමක් සම්බන්ධව 'සභාපති' යන වචනය යෙදෙන විට, පිළිවෙලින් සභාවේ සභාපති හා උප සභාපති අදහස් කරනු ලබන අතර, කිසියම් ප්‍රාථමික කාර්ය සභාවක උප සභාපති පැමිණ නොසිටි විටක, සාමාජිකයින් විසින් පත්කරගනු ලබන පුද්ගලයකු එම සභාවේ මුලසුන දරනු ඇත.

"චෝදනාව" යනුවෙන් අදහස් කරනුයේ, පරීක්ෂණ නිවේදනයේ නියම ආකාරයෙන් දක්වා ඇති චෝදනාවකි. 'සභාව' යනුවෙන් අදහස් කරනුයේ ආඥාපනතේ 12 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවයි. 'ආඥාපනත' යනුවෙන් හඳුන්වනු ලබන්නේ (105 වැනි අධිකාරය වන) වෛද්‍ය ආඥා පනතයි. වෛද්‍ය වෘත්තිකයා යනුවෙන් අදහස් කරනු ලබන්නේ ආඥා පනත යටතේ කුමන ආකාරයකින් හෝ ලියාපදිංචි වී ඇති පුද්ගලයෙකි. 'සභාපති' යනුවෙන් හඳුන්වනු ලබන්නේ සභාවේ සභාපති වේ.

'අදාළ ලියාපදිංචි ලේඛනය' යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(අ) වෛද්‍ය වෘත්තිකයකු සම්බන්ධයෙන් නම්, ශ්‍රී ලංකාවේ වෛද්‍ය සහ ශල්‍ය වෘත්තියේ යෙදීමට සුදුසුකම් ලත්, වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කරන ලේඛනයයි.

(ආ) දන්ත වෛද්‍යවරයෙක් සම්බන්ධයෙන් නම්, ශ්‍රී ලංකාවේ දන්ත කර්මය හා දන්ත ශල්‍ය කර්මය පිළිබඳ වෘත්තියේ යෙදීම පිණිස සුදුසුකම් ලත් දන්ත වෛද්‍යවරු ලියාපදිංචි කරන ලේඛනයයි.

(ඇ) 'ඇපොතිකරි' (සහකාර වෛද්‍ය) සම්බන්ධයෙන් නම්, ආඥාපනතේ 41 වන වගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ඔවුන් ලියාපදිංචි කිරීමේ ලේඛනයයි.

(ඈ) ඖෂධවේදීන් සම්බන්ධයෙන් නම් ශ්‍රී ලංකාවේ ඖෂධවේදීන් වශයෙන් ක්‍රියාකිරීමට සුදුසුකම් ලත් පුද්ගලයින් ලියාපදිංචි කරන ලේඛනයයි.

(ඉ) පවුල් සෞඛ්‍ය සේවිකාවන් සම්බන්ධයෙන් නම් ශ්‍රී ලංකාවේ පවුල් සෞඛ්‍ය සේවිකාවන් වශයෙන් වෘත්තියේ යෙදීමට සුදුසුකම්ලත් වනිතාවන් ලියාපදිංචි කරන ලේඛනයයි.

(ඊ) හෙදියන් සම්බන්ධයෙන් නම්, ශ්‍රී ලංකාවේ හෙදියන් වශයෙන් වෘත්තියේ යෙදීමට සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කරන ලේඛනයයි.

(උ) අතුරු වෛද්‍ය සහකාරවරුන් සම්බන්ධයෙන් නම් ශ්‍රී ලංකාවේ අතුරු වෛද්‍ය සහකාරවරුන් වශයෙන් වෘත්තියේ යෙදීමට සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කරන ලේඛනයයි.

කුමන හෝ පැමිණිල්ලක් හෝ වාර්තාවක් හෝ මෙම නියෝග යටතේ ගනු ලබන කුමන හෝ නීතිමය ක්‍රියා මාර්ගයක් සම්බන්ධයෙන්, පදාර්ථයන්ගෙන් වෙනත් ආකාරයකින් දැක්වෙන අවස්ථාවක හැර, මෙම නියෝග යටතේ වෘත්තිකයා යනුවෙන් කුමන හෝ සඳහන් කිරීමකදී, එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් හෝ නීතිමය ක්‍රියා මාර්ගයක් ඉදිරිපත් කරන ලද්දේ කවර පුද්ගලයෙකුට විරුද්ධව ද ඔහු අදහස් කෙරේ.

## 1 වන උපලේඛනය

(නියෝග 6)

### ප්‍රාථමික ක්‍රියාමාර්ග කමිටුව

1. අදාළ අවස්ථාවේ සිටින සභාවේ උප සභාපති සහ සභා රැස්වීමකදී සභාවේ සාමාජිකයින්ගේ රහස් ඡන්දයෙන් තෝරා ගන්නා ලද සාමාජිකයින් හතර දෙනෙකුගෙන්ද (මින්පසු 'කමිටුව' යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රාථමික කාර්ය කමිටුව සමන්විත වේ. ලේඛකාධිකාරී විසින් එවැනි රැස්වීමක් සම්බන්ධව සභාවේ සාමාජිකයින්හට අවම වශයෙන් දින දහයකටවත් කලින් දැනුම් දිය යුතුය.

2. කමිටුවේ සාමාජිකයෙකු ලෙස තෝරාපත් කරගත් සෑම පුද්ගලයකුම ඔහුගේ නිලය කලින් අතහැර නොගියේ නම්, ඔහු තෝරාපත් කරගත් දින සිට වසර තුනක කාලයක් සඳහා නිලය දරනු ලබන අතර, කුමන කරුණක් නිසා හෝ මෙම කාලය තුළ සාමාජිකයෙකු විසින් නිලය අතහැර ගියේ නම් ඔහුගේ සාමාජිකත්වය ද අවසන් වනු ඇත.

3. කමිටුවේ කුමන හෝ රැස්වීමක දී කමිටුවේ සාමාජිකයින් තිදෙනෙකුගෙන් ගණපූරණය සෑදෙනු ඇත.

4. සභාවේ උප සභාපතිවරයා කමිටුවේ සභාපති වන අතර, සියළුම රැස්වීම්වලදී ඔහු මූලාසනයේ කටයුතු කරනු ඇත. කුමන හෝ හේතුවක් නිසා හෝ කමිටුවේ කුමන හෝ රැස්වීමක් සඳහා උප සභාපතිවරයා පැමිණ නොසිටියහොත්, පැමිණ සිටින සාමාජිකයින් ඔවුන් අතුරෙන් කෙනෙකු මූලාසනයේ කටයුතු කිරීම සඳහා තෝරාපත් කර ගත යුතුය.

5. සාමාජිකයින් අතර කුමන හෝ පුරප්පාඩුවක් පැවතීම හෝ, කුමන හෝ සාමාජිකයෙකු පත් කිරීමේ දී ඇති වූ කුමන හෝ අඩුපාඩුවක් නිසා හෝ කමිටුවේ කුමන හෝ කටයුත්තක් හෝ ක්‍රියාමාර්ගයක් වලංගු නොවේ යැයි නොසැලකිය යුතුය.

6. කමිටුවේ කුමන හෝ රැස්වීමකදී තීරණයක් ගැනීම සඳහා ඇති සියළුම ප්‍රශ්න සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතුය. ප්‍රකාශ කරනු ලබන ඡන්ද සමාන වුවහොත් කමිටුවේ සභාපතිට හෝ කමිටුවේ කුමන හෝ රැස්වීමක මූලාසනයේ කටයුතු කරනු ලබන පුද්ගලයාහට, තමාගේ ම ඡන්දයට අමතරව තීරණ ඡන්දයක් හිමිවිය යුතුය.

7. ලේඛකාධිකාරීවරයා කමිටුවේ ලේකම් විය යුතුය. කමිටුවේ සියළුම රැස්වීම් ඔහු විසින් කැඳවිය යුතු අතර, එවැනි රැස්වීම් වලට පැමිණ සිටීමට ඔහුට හිමිකම් ඇති මුත්, ඒ සම්බන්ධ නියම සාකච්ඡාවලට සහභාගී නොවිය යුතුය.

8. කමිටුව විසින් යෝග්‍ය යැයි සිතනු ලබන ආකාරයට කමිටුවේ, කුමන හෝ රැස්වීමක් කලින් කලට පසුව එළඹෙන දිනයකට කල් තැබීමට පිළිවන.

9. කමිටුව පහත සඳහන් රාජකාරි ඉටු කළ යුතුය:–

(අ) මෙම නියෝගවලට අනුව, සභාපති විසින් කමිටුවට යොමු කරන ලද කුමන හෝ පැමිණිල්ලක් හෝ වාර්තාවක් සළකා බැලීම,

(ආ) එවැනි සළකා බැලීමකින් පසු, පරීක්ෂණ සඳහා වෘත්තීය චර්යා කමිටුවට යොමු කළ යුතු නඩුවක් තිබේ යැයි කමිටුව තීරණය කරන්නේ නම්, ඒ පිළිබඳ වාර්තාවක් සකස් කොට, වෘත්තීය චර්යා කමිටුවට ඉදිරිපත් කිරීම.

10. මෙම නියෝගය යටතේ වෘත්තීය චර්යා කමිටුවට පැමිණිල්ලක් හෝ වාර්තාවක් යොමු කරනු ලැබූ විටක, කමිටුව විසින් හැකි ඉක්මණින්, එවැනි පැමිණිල්ලක් හෝ වාර්තාවක් ගැන සළකා බලා එවැන්නක් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණු හෝ ගොනු කර ඇති දිවුරුම් පෙත්සම් ආදිය සම්බන්ධයෙන් කමිටුවේ වාර්තාව පිළියෙළ කොට වෘත්තීය චර්යා කමිටුවට ඉදිරිපත් කළ යුතුය.

11. කමිටුව විසින් යෝග්‍ය යයි සිතන්නේ නම් කමිටුව වෙත ඉදිරිපත් කරන ලද කුමන හෝ පැමිණිල්ලක් හෝ වාර්තාවක් සම්බන්ධයෙන්, ස්වකීය වාර්තාව වෘත්තීය චර්යා කමිටුවට ඉදිරිපත් කිරීමට පෙර, ඒ පිළිබඳ වැඩිදුර පරීක්ෂණ පැවැත්වීමට හෝ නඩුවේ ඇතුළත් කරුණු අනුව, නීතිඥවරයා ගෙන් හෝ නීති උපදේශකවරයාගෙන් අවශ්‍ය යයි සිතනු ලබන උපදෙස් හෝ සහාය ලබා ගැනීමට පිළිවන.

## 2 වන උපලේඛනය

(11 වැනි නියෝගය)

1. අදාළ අවස්ථාවේ සිටින සභාවේ සභාපති සහ සභාවේ රැස්වීමකදී කමිටුවේ සාමාජිකයින් නොවන සභාවේ සාමාජිකයින් අතරේ පවත්වනු ලබන රහස් ඡන්දයකින් තෝරා ගන්නා ලද තවත් සාමාජිකයින් 10 දෙනෙකුගෙන්, වෘත්තීය චර්යා කමිටුව සමන්විත වේ. ලේඛකාධිකාරී විසින් එවැනි රැස්වීමක් සම්බන්ධයෙන් සභාවේ සාමාජිකයින්හට අවම වශයෙන් දින දහයකටවත් කලින් දැනුම් දිය යුතුය.

2. වෘත්තීය චර්යා කමිටුවේ සාමාජිකයෙකු ලෙස තෝරාගත් සෑම පුද්ගලයෙකුම, ඔහුගේ නිලය කලින් අත්හැර නොගියේ නම්, ඔහු තෝරාපත් කරගත් දින සිට වසර තුනක කාලයක් සඳහා නිලය දරනු ලබන අතර, කුමන කරුණක් නිසා හෝ මෙම කාලය තුළ සාමාජිකයෙකු විසින් නිලය අත්හැර ගියේ නම්, ඔහුගේ සාමාජිකත්වය ද අවසන් වනු ඇත.

3. වෘත්තීය චර්යා කමිටුවේ කුමන හෝ රැස්වීමකදී වෘත්තීය චර්යා කමිටුවේ සභාපති හා සාමාජිකයින් 4 දෙනෙකුගෙන් ගණපූරණය සෑදෙනු ඇත.

4. සභාවේ සභාපතිවරයා වෘත්තීය චර්යා කමිටුවේ සභාපති වන අතර සියළුම රැස්වීම්වලදී ඔහු මූලාසනයේ කටයුතු කළ යුතු ය.

5. වෘත්තීය චර්යා කමිටුවේ බහුතර සාමාජික සංඛ්‍යාවක් විසින් වෙනත් ආකාරයකින් තීරණය නොකළේ නම්, වෘත්තීය චර්යා කමිටුවේ රැස්වීම් සෑම සතියකට වරක් පැවැත්විය යුතු ය.

6. වෘත්තීය චර්යා කමිටුවේ සෑම සාමාජිකයකුම එහි සෑම රැස්වීමකටම සහභාගි විය යුතු අතර, කිසියම් සාමාජිකයෙක් කිසියම් රැස්වීමකට සහභාගී නොවුයේ නම්, එවැනි සාමාජිකයකු හට වෘත්තීය චර්යා කමිටුව විසින් පවත්වනු ලබන පරීක්ෂණයට සම්බන්ධ කාර්යයන්ට සහභාගී වීමට ඉඩ නොලැබිය යුතු ය.

7. (1) වෘත්තීය චර්යා කමිටුවේ කුමන හෝ රැස්වීමකට සාමාජිකයින්ගේ පැමිණීම 3 වන ඡෙදයේ සඳහන් කරන්නට යෙදුණු ගණපූරණයට වඩා අඩු වූයේ නම්, එවැනි රැස්වීමක් වෙනත් දිනයකට කල් දැමිය යුතු ය.

(2) කුමන හේතුවක් නිසා හෝ කිසියම් පරීක්ෂණයකට සහභාගී වීමට සුදුසුකම් ලබන සාමාජික සංඛ්‍යාව ඉහත (3) ඡෙදයේ සඳහන් කරන්නට යෙදුනු ගණපූරණයට වඩා අඩු වේ නම්, අළුත් කමිටුවක් පිහිටු විය යුතු අතර, එසේ පිහිටුවනු ලැබූ කමිටුව ඉදිරියේ පරීක්ෂණය මුල සිට ආරම්භ කළ යුතුය.

8. ලේඛකාධිකාරීවරයා, වෘත්තීය චර්යා කමිටුවේ ලේකම්වරයා විය යුතුය. එවැනි රැස්වීමකට පැමිණ සිටීමට ඔහුට හිමිකම් ඇතත්, එහි නියම සාකච්ඡාවලට සහභාගී නොවිය යුතුය.

9. මෙහි හතරවන උපලේඛනයේ නියම වශයෙන් දක්වා ඇති ප්‍රශ්න හැර වෘත්තීය චර්යා කමිටුවේ කුමන හෝ රැස්වීමකදී තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම ප්‍රශ්න එහි සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය විය යුතුය. ඡන්ද සංඛ්‍යාව සමාන වූ විටක, සභාපතිවරයා හට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතුය.

## 3 වන උපලේඛනය

## පරීක්ෂණ නිවේදන ආකෘති පත්‍රය

(නියෝග 12.3)

19.....................

කොළඹ,

මහත්මයාණෙනි/මහත්මියනි,

ඔබට විරුද්ධව වෘත්තීය චර්යා කමිටුවට ඉදිරිපත් කර ඇති, පැමිණිල්ලක්/වාර්තාවක් හේතුකොට ගෙන ඔබට විරුද්ධව පහත සඳහන් චෝදනාව/චෝදනා සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වනු ලබන බව වෘත්තීය චර්යා කමිටුව වෙනුවෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

(චෝදනාව/චෝදනා මෙහි සඳහන් කරන්න)

ඔබට විරුද්ධව ඇති ඉහත සඳහන් චෝදනාව/චෝදනා සම්බන්ධයෙන් සලකා බැලීම පිණිසත්, ආඥපනතේ (105 වැනි අධිකාරය වන) 25(1)(අ), යටතේ ක්‍රියා කිරීමට වෘත්තීය චර්යා කමිටුව විසින් නියෝග කළ යුතු ද නැත්ද යන්න පිළිබඳව තීරණය කිරීම පිණිසත් 19............ දින ............ දින පෙ.ව/ප.ව ......... දී වෘත්තීය චර්යා කමිටු රැස්වීමක් පැවැත්වෙන බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

ඉහත සඳහන් චෝදනාවට/චෝදනාවලට ලිඛිතව පිළිතුරු සපයන ලෙසටත් පෞද්ගලිකවම හෝ නීතිඥවරයෙකුගේ මාර්ගයෙන් හෝ, ඉහත සඳහන් ස්ථානයේදී හා වේලාවට වෘත්තීය චර්යා කමිටුව ඉදිරියේ පෙනී සිටින ලෙසටත්, ඔබගෙන් ඉල්ලා සිටිනු ලැබේ. ඔබ එසේ පෙනී නොසිටියහොත් ඔබ නොමැතිව ඉහත සඳහන් චෝදනාව/චෝදනා විභාග කොට, තීරණය කිරීමට වෘත්තීය චර්යා කමිටුවට බලය ඇත.

එකී චෝදනාව/චෝදනා සම්බන්ධයෙන් කුමන හෝ පිළිතුරක්, නිදහසට කරුණු ඉදිරිපත් කිරීමක් වෙනත් ප්‍රකාශයක් හෝ පණිවුඩයක් දීමට ඔබ අදහස් කරන්නේ නම් එය පරීක්ෂණය පැවැත්වීමට නියමිත දිනට දින ............ කට කලින් වෘත්තීය චර්යා කමිටුවේ නීතිඥවරයා හට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

කුමන හේතුවක් නිසා හෝ පරීක්ෂණය කල් දැමිය යුතු යැයි ඔබ අදහස් කරන්නේ නම් එසේ කල් දැමීම අවශ්‍ය වන්නේ කුමන හේතුවක් නිසා ද යන වග දන්වා ඒ සම්බන්ධයෙන්, අයදුම්පතක් වහාම වෘත්තීය චර්යා කමිටුවේ නීතිඥවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

වෛද්‍යවිනය (ක්‍රියා පරිපාටි) නියෝග වල පිටපතක් ඔබගේ දැන ගැනීම පිණිස මේ සමඟ එවා ඇත.

ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නීතිඥ

## 4 වන උපලේඛනය

(නියෝග 34(1) සහ 40(3))

නියෝග 34(1) සහ 40(3) අදාළ වන ප්‍රශ්න

1. වෘත්තිකයා පෙනී නොසිටියත්, වෘත්තීය චර්යා කමිටුව විසින් පරීක්ෂණය පවත්වා ගෙන යා යුතු ද නැත් ද යන්න පිළිබඳ ඕනෑම ප්‍රශ්නයක්.

2. ප්‍රමාණවත් සාක්ෂි ගෙන හැර දක්වා නොමැතිකම හෝ චෝදනාවකින් කියවෙන කරුණු අනුව, කුමන හෝ වෘත්තීයමය ආකාරයකින් අපකීර්තිමත් හැසිරීමක් තහවුරු නොකෙරේය යන කරුණු ද ඇතුළත්ව නීතිමය ප්‍රශ්නයක් මත ඉදිරිපත් කරනු ලබන කරුණු හෝ විරුද්ධවීම්, වෘත්තීය චර්යා කමිටුව විසින් පිළිගන්නේද නැද්ද යන්න පිළිබඳව ඕනෑම ප්‍රශ්නයක්.

3. කුමන හෝ චෝදනාවක් සම්බන්ධයෙන් වෘත්තීය චර්යා කමිටුවේ තීරණය කල් දැමිය යුතුද නැද්ද යන්න පිළිබඳ ඕනෑම ප්‍රශ්නයක්.

02 – 160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.